# කාර්යසාධන වාර්තාව

# 2016

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව


නො: 330,

යූනියන් පෙදෙස,

කොළඹ 02.

දුරකතන : *011- 2421211*

ෆැක්ස් : *011- 2434291*

# පෙරවදන

2013/2014 මහකන්නයේ පැවති නියගය හේතුකොටගෙන කන්නයේ ලැබිය යුතුව තිබූ වී අස්වැන්න නොලැබීම නිසා, එම වර්ෂයේ ලංකා සතොස ආයතනය විසින් ආනයනය කරන ලද සහල් තොග දෙපාර්තමේන්තු ගබඩාවන්හි ගබඩා කර පවත්වාගෙනයාම සඳහා කුලී පදනම මත ගබඩා ලබාදීම හේතුවෙන් 2015 වර්ෂයේ මෙන්ම 2016 වර්ෂයේද ආරක්ෂිත සහල් තොග පවත්වාගෙනයාමේ කාර්යභාරයෙන් තාවකාලිකව බැහැරවීමට දෙපාර්තමේන්තුවට සිදුවන ලදී. එසේ නමුදු සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉහත කී අවස්ථාවන්හි ආනයනය කරන ලද සහල් තොගය පවත්වාගෙනයාමේ හා නිකුත් කිරීමේ කාර්යභාරය දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුලදී පවත්වාගෙන යන ලදී. එසේම සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගෙන්වන ලද මෙ.ටො.4300 කට ආසන්න සහල් තොගය ගබඩා ගතකර පවත්වාගෙනයාමේ කාර්යභාරය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

ඉහත කී තත්වයන් යටතේ 2016 වසර ප්‍රමුඛ වශයෙන් සහල් තොග පවත්වාගෙනයාම සඳහා මෙන්ම වෙනත් ගබඩා අවශ්‍යතාවන් උදෙසා දෙපාර්තමේන්තුව සතු ගබඩා කුලී පදනම මත ලබාදීම තුලින් ආදායම් ඉපයූ වර්ෂයක් බවට පත්වූ අතර ඒ අතරට ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ නිවාස කුලියට දීම මඟින් උපලබ්ධි කරගන්නා ලද ආදායමද ඇතුලත්ව ඇත. ඒ අනුව වර්ෂය තුලදී රු.96,765,798.24 කින් රජයේ ආදායමට දායකත්වය සපයන්නට දෙපාර්තමේන්තුවට හැකිවී ඇත. ඒ අනුව ආදායම ප්‍රවර්ධනය කරලීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු අවධානය යොමු කරන ලදී.

ඊට ප්‍රතිරූප වශයෙන් ගබඩා අලුත්වැඩියා කිරීමට හා ප්‍රතිපාදන සලසාදීමට ආමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ බැවින් අදාල ප්‍රතිපාදන භාවිතා කරමින් දෙපාර්තමේන්තුවට අයත් වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ පැවති මෙට්‍රික් ටොන් 5000 ක ධාරිතාවක් සහිත ගබඩා 05 ක් නවීකරණය කිරීමේ කටයුතු වර්ෂය තුලදී ආරම්භ කිරීමට හැකිවීම විශේෂ අවකාශයක් සේ සැලකිය හැකිය.

දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතුව පැවති සමූපකාර ණය ශේෂ හා තොග හිඟ ණය ශේෂ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් අයකර ගනිමින් එම ශේෂයන් අවම කර ගැනීමත් , අය නොවෙමින් පවත්නා ණය ශේෂයන් සඳහා නීතිමය ක්‍රියාමාර්ගයන්ට අවතීර්ණ වීම මඟින් රජයට අයවිය යුතුව පවත්නා හිඟ ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාපිළිවෙත් අනුගමනය කිරීමත් 2016 වසර තුලදී ක්‍රියාත්මක කරන්නට යෙදුනු වැඩසටහන් අතරට එක්විය.

දෙපාර්තමේන්තු ගබඩාවක් වෙත ලැබෙන සහල් තොග හා ඒවා පවත්වාගෙනයාමේදී අවශ්‍ය වන රසායනාගාර පරීක්ෂාවන් හා තත්ත්ව පරීක්ෂාවන් සිදුකිරීම සඳහා අඩුපාඩුවක්ව පැවති රසායනාගාරයක අවශ්‍යතාවය සඵල කරමින් වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ පැවති කුඩා ගබඩාවක් රසායනාගාරයකට අවශ්‍ය අංගෝපාංගයන් සහිතව නවීකරණය කර රසායනාගාර කටයුතු ආරම්භ කිරීමත්, නව ප්‍රවනතාවක් වශයෙන් ධූමායන සේවා බාහිර ආයතන වෙත සැපයීම මඟින් ආදායම වර්ධනය කරලීමටත් ඒ අනුව ලෝක ආහාර සංවිධානය වෙත ධූමායන සේවා සලසා දීමෙන් රු. 2,205,771.60 කින් රජයේ ආදායමට දායකත්වය සැලසීමත්, කටයුතු කිරීමත් 2016 වර්ෂයේ කැපී පෙනෙන මං සලකුණු තැබුනු සංධිස්ථාන විය. මේ සෑම පියවරක් හමුවේම ඒවාට අවශ්‍ය අනුමැතිය හා උපදෙස් සලසා දෙමින් රේබීය අමාත්‍යවර ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමන් හා එම අමාත්‍යංශ ලේකම් ධුරන්ධර ගරු ටි.එම්.කේ.බි.තෙන්නකෝන් මැතිතුමන් විසින් ලබාදෙන ලද සහාය ස්තුති පූර්වකව සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

එමෙන්ම 2016 වර්ෂය සඳහා වූ උපාය මාර්ගික සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම මඟින් අපේක්ෂිතව පැවති කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම උදෙසා කැපවීමෙන්, ධෛර්යයෙන් හා ධනාත්මක ආකල්පයන්ගෙන් පෝෂිතව ක්‍රියාත්මක වූ කාර්ය මණ්ඩලය වෙතද, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශයේ හා ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලැබූ අනිකුත් රාජ්‍ය ආයතනයන්හි කාර්ය මණ්ඩල වෙතින් ලද සහාය සඳහාද, භක්ත්‍යාදර පූර්වකව ස්තුතිය පුද කිරීම සඳහා මෙම පෙරවදන ඉවහල් කර ගනිමි.

එමෙන්ම දෙපාර්තමේනතුව මඟින් සැලකිය හැකි මෙහෙවර උපරිම ලෙස ඉටුකරමින් දේශයේ ජනතාවගේ ආහාර අවශ්‍යතාව ඉටුකරලීම සඳහා පූර්ණ දායකත්වය සලසා දීමටත් එමඟින් ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම යන දැක්ම සාක්ෂාත් කරගැනිමත් දෙපාර්තමේන්තුවේ ඒකායන අධිෂ්ඨානය වන බව සටහන් කරනුයේ ඉමහත් සතුටිනි.



ජේ.ක්‍රිෂ්ණමූර්ති
ආහාර කොමසාරිස්
2017 මාර්තු මස 30 වන දින

යුනියන් පෙදෙස
කොළඹ 02
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

# පටුන


| | | |
|---|---|---|
| 1. | ආහාර දෙපාර්තමේන්තුව දැක්ම මෙහෙවර | 06 |
| 2. | ආහාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් | 07 |
| 3. | සංවිධාන ව්‍යුහය | 08 |
| 4. | පාලන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය | 09-12 |
| 5. | විගණන හා විනය පාලන කටයුතු | 13 |
| 6. | නීතිමය කටයුත | 14-16 |
| 7. | දෙපාර්තමේන්තුව සතු ගබඩා සහ නිවාස | 17-23 |
| 8. | ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය | 24-25 |
| 9. | වත්කම් හා දේපල | 26 |
| 10. | ආදායම් සහ අයවීම් | 27 |
| 11. | මූල්‍ය වාර්තා | 28-30 |
| 12. | ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය | 31 |

# (01). ආහාර දෙපාර්තමේන්තුවේ දැක්ම මෙහෙවර

## දැක්ම

"ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සැම නිවසකටම".

## මෙහෙවර

"ධාන්‍යමය ආහාර ද්‍රව්‍යයන්හි වෙළඳපොළ සුලභතාව, පාරිභෝගිකයාට ළඟා වීමේ පහසුව සහ පාරිභෝගික මිලදී ගැනීමේ හැකියාව සුරක්ෂිත කිරීම උදෙසා ආහාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පාර්ශව, දෙපාර්තමේන්තුව සතු වත්කම් සහ කාර්යක්ෂම වූත්, කැපවූත් සේවක සමූහයා සමඟ මනා ලෙස සම්බන්ධීකරණය මඟින් ආහාර දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම".

# (02) ආහාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

**01. දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො. 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**

දකුණු ආසියාතික කලාපීය රටවල හදිසි හා ආපදා සහිත අවස්ථාවලදී ප්‍රයෝජනයට ගතහැකිවන පරිදි මෙ.ටො.8000 ක සහල් සංචිතයක් ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යා යුතු බව එකී සංවිධානයේ 16 වන සමුළුවේ දී තීරණය කර ඇත.

**02. 2008/8/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.**

2008/8/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අර්බුදකාරී අවස්ථාවන්හි දී ප්‍රයෝජනයට ගැනීම සඳහා මෙ.ටො.100,000 ක සුරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාමේ අරමුණින් යුතුව ආහාර දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකොට ඇත.

**03. වෙළඳපොළ සහල් සුලභතාවය පිළිබඳ සහතික වීම**

වෙළඳපොළ සහල් හිඟයන් ඇතිවීම තුළින් ඇතිවිය හැකි මිල උච්ඡාවචනයන් පාලනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය අවස්ථාවන්හි දී වෙළඳපොළට තොග මුදා හැරීමෙන් සහල් මිල දි ගැනීමේ හැකියාව පාරිභෝගිකයා වෙත ලබා දීම.

**04. ආයතනයේ සම්පත් මනා කළමනාකරණය සඳහා අදාළ පාර්ශවයන් (Stake holders) සමඟ මනා සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.**

දෙපාර්තමේන්තුව සතු ගබඩාවන් සහ නිවාස මනා උපයෝගිතාවයකට ලක් කිරීම සඳහා අතිරික්ත ගබඩා හා නිවාස ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව පදනම්කොට කුලියට ලබා දීමෙන් රාජ්‍ය ආදායමට දායකත්වයක් දැක්වීම.

**05. කෘමි උවදුරුවලින් තොර ධාන්‍යමය ආහාර ගබඩා පරිසරයක් ඇති කිරීම.**

ඉහළ ගුණත්වයෙන් යුතු ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා පළිබෝධ උවදුරෙන් තොර ගබඩාවන් පවත්වාගෙන යාම තුළින් පාරිභෝගිකයා වෙත ගුණත්වයෙන් ඉහළ ධාන්‍යමය ආහාර සැපයීම.

# (03) සංවිධාන ව්‍යුහය


ආහාර කොමසාරිස්
නියෝජ්‍ය ආහාර කොමසාරිස්
ප්‍රධාන ගණකාධිකාරී
නීති නිලධාරී
සහකාර ආහාර කොමසාරිස්
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
තත්ත්ව පාලන නිලධාරී
වැඩ පරීක්ෂක
නීති අංශය
සැපයුම් අංශය
පාලන අංශය
ප්‍රවාහන අංශය
තොරතුරු තාක්ෂණ අංශය
තත්ත්ව පාලන අංශය
ගිණුම් අංශය

# (04) පාලන ව්‍යුහය හා කාර්යය මණ්ඩලය

- **පාලන ව්‍යුහය :**

ආහාර කොමසාරිස් විසින් ක්‍රියාත්මක කළ පරිපාලන හා මෙහෙයුම් වැඩ සටහන්, ක්‍රියාකාරී අන්දමින් සිදුවෙමින් පැවතිණි.

2016 වසර සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම ගිණුම් කටයුතු ගණකාධිකාරීවරිය විසින්ම සිදු කරන ලදි.

ත්‍රිකුණාමලය නිවාස 366 කළමනාකරණය සඳහා ත්‍රිකුණාමලය ස්ථානභාර නිලධාරී කටයුතු කරන ලදි. වේයන්ගොඩ දිසා ධාන්‍යාගාරයේ කළමනාකරණය සඳහා වේයන්ගොඩ ස්ථානභාර නිලධාරී කටයුතු කරන ලදි.

දෙපාර්තමේන්තුවේ නීති අංශය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමන්ගේ අනුමැතිය යටතේ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නීති උපදේශකගේ වැඩ බැලීම මත කටයුතු කරන ලදි.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අනුමත තනතුරු 82 සඳහා I, II, III පංතිවලට අයත් නිලධාරී මහත්ම මහත්මීන් 30 දෙනෙකු ද විවිධ තනතුරුවලට අයත් අනුමත දෙපාර්තමේන්තු ගත සේවක තනතුරු 84 සඳහා සේවකයින් 53 දෙනෙකු ද ඇතුළුව මුළු අනුමත සේවක සංඛ්‍යාව වූ 230 සඳහා 2016.12.31 දිනට කාර්යය මණ්ඩලයේ 119 දෙනෙකු සේවයේ යෙදී ඇත.

2016.01.01 දිනට සේවයේ සිටි මුළු සේවක සංඛ්‍යාවෙන් 5% ක් වසර තුළදී විශ්‍රාම ගැනීම සිදුවිය. එසේම නව සංවර්ධන නිලධාරීන් 01 ක්, රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් 06 ක් 2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට ලැබී ඇත. එසේම 2016 වර්ෂය මැයි මස දෙපාර්තමේන්තුවට නව ආහාර කොමසාරිස්තුමියකගේ පැමිණීම විශේෂ සිදුවීමක් ලෙස දැක්විය හැක.

## 2016 ආහාර දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය

| | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2016.12.31 දිනට සේවයේ නියුතු |
|---|---|---|---|
| 01 | ආහාර කොමසාරිස් | 01 | 01 |
| 02 | නියෝජ්‍ය ආහාර කොමසාරිස්/සහකාර ආහාර කොමසාරිස් | 02 | 01 |
| 03 | ගණකාධිකාරී | 02 | 02* |
| 04 | පරිපාලන නිලධාරී | 01 | - |
| 05 | භාෂා පරිවර්තක | 01 | - |
| 06 | තත්ත්ව පාලන නිලධාරී | 01 | 01 |
| 07 | ධාන්‍ය සමීක්ෂක | 01 | - |
| 08 | වැඩ පරීක්ෂක | 02 | 01 |
| 09 | තොරතුරු හා සන්නිවේදන සහකාර | 01 | 01 |
| 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 82 | 30 |
| 11 | සංවර්ධන නිලධාරී | 22 | 07 |
| 12 | වාප්පු ක්ෂේත්‍ර සේවය | 08 | 08 |
| 13 | රියදුරු | 10 | 06** |
| 14 | කාර්යාල සේවක සේවය | 22 | 11 |
| 15 | ධූමායනකරු | 26 | 12 |
| 16 | රිය සහකරු | 02 | 09 |
| 17 | වාප්පු ක්ෂේත්‍ර කම්කරු | 01 | 01 |
| 18 | මුරකරු | 21 | 21 |
| 19 | ගබඩා කම්කරු | 24 | 01*** |
| 20 | අභ්‍යාසලාභී උපාධිධාරී | - | 06 |
| **එකතුව** | | **230** | **119** |

* වැඩබැලීමේ පදනම මත පුරප්පාඩු වී ඇති ගණකාධිකාරී තනතුරේ එක් නිලධාරියෙකු රාජකාරියේ නිරත වේ.

** ස්ථිර රියදුරු තනතුරු 5 ක් හා අනියම් පදනම මත එක් රියදුරකු බඳවා ගෙන ඇත.

*** ගබඩා කම්කරු තනතුර සඳහා ආදේශක පදනම මත එක් කම්කරුවෙකු බඳවා ගෙන ඇත.

- 2016 ආහාර දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සේවයේ නියුතු සේවක සංඛ්‍යාව



I. නව පත්වීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ගණකාධිකාරී | 01 |
| 02 | සංවර්ධන නිලධාරී | 01 |
| 03 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| 04 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 |
| 05 | ආදේශක ගබඩා කම්කරු | 01 |
| 06 | අභ්‍යාසලාභි උපාධිධාරී | 08 |

II. විශ්‍රාම ගැන්වීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| 02 | ධූමායනකරු | 01 |
| 03 | රිය සහකරු | 01 |
| 04 | මුරකරු | 01 |

III . ස්ථානමාරු වී යාම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආහාර කොමසාරිස් | 01 |
| 02 | ගණකාධිකාරී | 01 |
| 03 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| 04 | සංවර්ධන නිලධාරී | 02 |
| 05 | රියදුරු | 03 |
| 06 | කාර්යාල සේවක සේවය | 01 |
| 07 | අභ්‍යාසලාභි උපාධිධාරී | 02 |

IV. ස්ථානමාරු වී පැමිණීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආහාර කොමසාරිස් | 01 |
| 02 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| 03 | රියදුරු | 01 |

V. දෙපාර්තමේන්තු සේවයෙන් මුදාහැරීම්

| # | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රයෝගික අභ්‍යාසලාභී පරිගණක පුහුණු | 01 |
| 02 | සහන කම්කරු | 01 |

# (05). විගණන හා විනය පාලන කටයුතු

## ▪ විගණනය :

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන කාර්යය මණ්ඩලයෙන් සමන්විත රජයේ විගණන අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇත. එමගින් අවශ්‍ය අවස්ථාවන්හි දී කරනු ලබන විගණනයන්ට අමතරව අවසන් ගිණුම් විගණන කටයුතු ද සිදු කෙරේ.

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් මෙහෙයවනු ලැබූ අතර විගණකාධිපතිවරයා විසින් හා දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටි, රජයේ විගණන අංශය වෙතින් එවනු ලබන විගණන විමසුම් සඳහා වන පිළිතුරු අමාත්‍යාංශය වෙත පිටපත් සහිතව අදාළ පාර්ශවයන් වෙත සෘජුවම යැවීමට කටයුතු කර ඇත.

ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත 2016 වසරේ දෙසැම්බර් 31 වන දින වන විට විගණන විමසුම් 27 ක් ලැබී ඇති අතර එම 27 සඳහාම පිළිතුරු ලබා දී ඇත.

## ▪ විනය පාලන කටයුතු :

2016 වර්ෂයේ දී නිලධාරීන්ට එරෙහිව විධිමත් විනය පරීක්ෂණ පවත්වා නොමැත.

# (06). නීතිමය කටයුතු

2016 වසරේ අවසානය වන විට ආහාර දෙපාර්තමේන්තුව විසින් යෙදී සිටි නීතිමය කටයුතු සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| | ස්වභාවය | නීතිමය කටයුතු සංඛ්‍යාව |
|---|---|---|
| I | අගරු චෙක්පත් මුදල් අයකර ගැනීම | 02 |
| II. | අධිභාර අයකර ගැනීම | 06 |
| III. | ණය ශේෂ අයකර ගැනීම | 04 |
| IV. | හිඟ ගබඩා කුලී අය කර ගැනීම | 07 |
| V. | ධාන්‍යගම නිවාසවල අස්කිරීමේ නිවේදන යැවීම හා සන්තකය ආපසු ලබාගැනීම. | 14 |
| **එකතුව** | | **33** |

- අක්මීමන විවිධ සේවා සමුපකාර සමිතිය, අගරු චෙක්පත් මුදල් අයකර ගැනීම මේ වන විට රු.1,800,000.00 ක මුදලක් ගෙවා ඇති අතර තව දුරටත් රු.50,000.00 ක මුදලක් සහ අගරු චෙක්පත් ගාස්තු වශයෙන් රු.65.00 ක මුදලක් ගෙවිය යුතුව ඇත. නොකඩවා මුදල් ගෙවීම සිදු කරනු ලබයි.

- කොග්ගල ආහාර ගබඩාවට අදාල අයවිය යුතු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

- ඩබ්.එච්.සුමතිපාල මහතා,අධිභාර මුදල් අයකර ගැනීම - මොහුගෙන් අයවිය යුතු රු.6,384,486.19 ක මුදල අයකර අප වෙත එවන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂක ජෙනරාල් වෙත දන්වා යැවීමට කටයුතු කර ඇති අතර මෙතෙක් එම මුදල් අයකර අප දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කර නොමැත.

- ඒ.ඩබ්.ගුණසේකර මහතා, අධිභාර මුදල් අයකර ගැනීම - මොහුගෙන් අයවිය යුතුව ඇති රු.847,349.43 ක මුදල ලබා ගැනීම සඳහා මහනුවර දිසා අධිකරණයේ ගොනු කර ඇති ඩී.එම්.ආර්./1046 නඩුව 2017.03.01 දින නැවත විභාග වීමට නියමිත අතර මීලඟ නඩු දිනයේදී හිටපු ගණකාධිකාරී (ප්‍රේශණ) එච්.ජී.සෝමපාල මහතාගේ සාක්ෂි විමසීමට නියමිතය.

- විල්පට් බෝපගේ මහතා, අධිභාර මුදල් අයකර ගැනීම - මොහුගෙන් අයවිය යුතුව ඇති රු.1,314,236.58 ක මුදල ලබා ගැනීම සඳහා ගාල්ල දිසා අධිකරණයේ ගොනු කරන ලද 6015/එම්/05 නඩුවට අදාලව 2000/11/16 දින ලබාදී ඇති නඩු තීන්දුව පරිදි බෝපගේ මහතා විසින් මුදල් ගෙවා නොමැත. එබැවින් ඇස්කීසි ක්‍රියාත්මක කිරීම සඳහා ගාල්ල කඩවත්සතර ප්‍රා/ලේ වෙතින් උක්ත විත්තිකරුගේ දේපල පිළිබඳ විස්තර විමසීමේදී නිවැරදි තොරතුරු අප වෙත ලබා නොදීම සම්බන්ධයෙන් අදාල ප්‍රා/ලේ වෙතින් කරුණු විමසීමට කටයුතු කර ඇත. 2017.01.05 දින සිහි කැඳවීමක් යවා ඇත.

- එන්.ඊ.පණ්ඩිතරත්න මහතා, අධිභාර මුදල් අයකර ගැනීම - මොහුගෙන් අයවිය යුතුව ඇති රු.376,153.35 ක මුදල ලබාගැනීම සඳහා අත්තනගල්ල දිසා අධිකරණයේ 1216/එම් නඩුව ගොනුකර ඇති අතර, පණ්ඩිතරත්න මහතා මේ වන විට මියගොස් ඇති බැවින්, අදාල මුදල් අයකර ගැනීම සඳහා ඔහු වෙනුවෙන් ඔහුගේ බිරිද සහ දරුවන් ආදේශ කිරීම සඳහා අදාල වන ලේඛන ලබා ගැනීම සඳහා මීරිගම පොලීසිය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇත.

- ඕ.ජගත්වීර මහතා, අධිභාර මුදල් අයකර ගැනීම - මොහුගෙන් අයවිය යුතුව ඇති රු.371,180.23 ක මුදල ලබා ගැනීම සඳහා ගම්පහ දිසා අධිකරණයේ පවරන ලද 2749/එම් නඩුවෙහි 2012.11.05 වන දිනැති තීන්දුව පරිදි මුදල් ලබා ගැනීම සඳහා මොහුට විරුද්ධව ඇස්කිසි නොතීසි නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී.

- එච්.ඒ.එස්.විමලසිරි මහතා, ණය ශේෂ අයකර ගැනීම - මොහුගෙන් අයවිය යුතුව ඇති රු. 323,321.00 ණය මුදල රු.3000.00 බැගින් වාරික වශයෙන් ගෙවීමට ආහාර කොමසාරිස් සමඟ ඇති කරගත් එකඟතාවය පරිදි නොකඩවා මුදල් ගෙවීම සිදුකරනු ලබයි.

- ශාන්ත මල්වාන මහතා,ණය ශේෂ අයකර ගැනීම - මොහුගෙන් අයවිය යුතුව ඇති රු. 109,496.00 ක ණය මුදල අයකර ගැනීම සඳහා නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ලේඛන නිතීපති දෙපාර්තමේනතුව වෙත යොමුකර ඇත.

- ඔරුගොඩවත්ත 10,14,16 වන්දි නඩුව - නඩු අංක ඩී.එම්.ආර්/01815 යටතේ නඩුව විභාග විය. ඇස්කීසි ක්‍රියාත්මක කර වන්දි මුදල වන රු.1,028,500.00 ක මුදල අයකර ගැනීමට නඩු තීන්දුව ලබා දී ඇත. අදාල ලිපිනයේ එවැනි ආයතනයක් නොමැති බව ෆිස්කල් අධිකරණයට වාර්තා කර ඇත.

- වැලිසර අංක 05 ගබඩාවට අදාලව ඩී.එම්.ආර්/00029/10 නඩු තීන්දුව යටතේ එම්.ආර්.එම්.සහීල් මහතා ගෙවිය යුතුව තිබු රු.910,602.91 ක මුදල 2016.03.16 දින වන විට වාරික වශයෙන් සම්පුර්ණයෙන් ගෙවා නිම කර ඇත.

- මාතර මැදවත්ත, බදුල්ල හා නාරාහේන්පිට ගබඩා වෙනුවෙන් ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිතිය ඇතිකරගත් සමථය පරිදි වාරික මුදල් නිසි පරිදි නොගෙවන බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

- දෙපාර්තමේන්තුවේ ආපන ශාලාව වෙනුවෙන් ජී.ඒ.රංජිත් කුමාර මහතා ගෙවිය යුතු රු.862,354.27 ක මුදල, කෑගල්ල පරගමමන අංක 01, 02 හා 03 ගබඩාවන්ට අදාලව විජිත සමූහ ව්‍යාපාරය ගෙවිය යුතු රු. 541,017.60 ක මුදල සහ මල්කඩුවාව G1. ගබඩාවට අදාලව නිකවැරටිය ග්‍රීන්වැලි ප්ලාන්ටේෂන් (පුද්) සමාගම ගෙවිය යුතු රු.2,298,029.98 ක මුදල අයකර ගැනීමට අවශ්‍ය නීතිමය කටයුතු සිදුකර දෙන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකොට ඇත.

- ත්‍රිකුණාමලය ධාන්‍යගම නිවාස සංකීර්ණයේ නිවාස 06 ක් සදහා අස්කිරීමේ නිවේදන යොමුකොට ඇති අතර නිවාස 08 ක සන්තකය අපසු ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී.

# (07). දෙපාර්තමේන්තුව සතු ගබඩා සහ නිවාස

## ■ දෙපාර්තමේන්තුව සතු ගබඩා :

ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා දිස්ත්‍රික්ක 21 ක පිහිටා ඇති අතර සංඛ්‍යාත්මකව එය 103 කි. රාජ්‍ය දේපළ මනාව කළමනාකරණය කිරීමේ අදහසින් එම දේපළ පහත පරිදි කාර්යයන්හි යොදවා ඇත.

| # | ගබඩා | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත මාසික කුලී පදනම මත ලබා දී ඇති ගබඩා | 47 |
| 2 | කුලී රහිතව රාජ්‍ය අංශයේ ආයතන වෙත ලබා දී ඇති ගබඩා | 29 |
| 3 | ආහාර දෙපාර්තමේන්තුව භාවිතා කරන ගබඩා | 13 |
| 4 | දිස්ත්‍රික් ලේකම්/ප්‍රා.ලේකම් භාරයේ ඇති ගබඩා | 12 |
| 5 | පාවිච්චි නොකරන නිෂ්ක්‍රිය ගබඩා | 02 |
| | **එකතුව** | **103** |

## ■ දෙපාර්තමේන්තුව සතු නිවාස :

ආහාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිවාස 366 ක් ත්‍රිකුණාමලයේ, චීන වරායේ, ධාන්‍යගම පිහිටා ඇති අතර එම නිවාස පහත සඳහන් පරිදි භාවිතයට ගනු ලැබේ.

| # | 2016.12.31 දිනට භාරය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ආහාර දෙපාර්තමේන්තු කාර්යාලය | | 01 |
| 2. | සංචාරක නිවස | | 01 |
| 3. | අයදුම්කරුවන් වෙත ලබාදීමට නියමිත | | 05 |
| 4. | කුළියට ලබා දුන් | | |
| | • | ප්‍රීමා ආයතනයේ සේවකයින් සඳහා | 182 |
| | • | පෞද්ගලික ආයතන සඳහා | 01 |
| | • | රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා | 65 |
| | • | ත්‍රිවිධ හමුදාව හා පොලීසිය | 56 |
| | • | අර්ධ රාජ්‍ය ආයතන සඳහා | 55 |
| | එකතුව | | **366** |

## ❖ ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා විස්තරය

2016.12.31 දිනට දෙපාර්තමේන්තුව භාරයේ හා දැනට කුලී රහිතව හෝ කුලියට දී ඇති ගබඩා සම්බන්ධ වාර්තාව පහත දක්වා ඇත.

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **කොළඹ දිස්ත්‍රික්කය** | | | | |
| 01 | ඔරුගොඩවත්ත - 01 | 24624 | 6000 | ශ්‍රී ලංකා රේගුව |
| 02 | ඔරුගොඩවත්ත - 02 | 24624 | 6000 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය |
| 03 | ඔරුගොඩවත්ත - 03 | 20304 | 5000 | අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| 04 | ඔරුගොඩවත්ත - 04 | 19008 | 5000 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය |
| 05 | ඔරුගොඩවත්ත - 05 | 19008 | 4500 | අයිකොන් ඩිස්ට්‍රිබියුටර්ස් |
| 06 | ඔරුගොඩවත්ත - 06 | 20304 | 5000 | අධ්‍යාපන සේවා අමාත්‍යංශය |
| 07 | ඔරුගොඩවත්ත - 07 | 20304 | 5000 | ආපදා සහන සේවා මධ්‍යස්ථානය |
| 08 | ඔරුගොඩවත්ත - 08 | 16560 | 4000 | අධ්‍යාපන සේවා අමාත්‍යංශය |
| 09 | ඔරුගොඩවත්ත - 09 | 16560 | 4000 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය |
| 10 | ඔරුගොඩවත්ත - 12 | 18183 | 4000 | ශ්‍රී ලංකා රේගුව |
| 11 | ඔරුගොඩවත්ත - 10 | 13436 | | යුනික් කන්ටේනර්ස් ටර්මිනල්ස් (පුද්.) සමාගම |
| 12 | ඔරුගොඩවත්ත - 14 | 11448 | | |
| 13 | ඔරුගොඩවත්ත - 15 | 18206 | | |
| 14 | ඔරුගොඩවත්ත - 16 | | | |
| 15 | කාර්යාල ගොඩනැගිල්ල | 1115 | | |
| 16 | රත්මලාන - 03 | 41200 | 7520 | රතු කුරුස සමාජය |
| 17 | රත්මලාන - 05 | 21008 | 2900 | ලංකා සතොස |
| 18 | රත්මලාන - 04 | 19032 | 2580 | කම්කරු දෙපාර්තමේන්තුව |
| **එකතුව** | | 324924 | 61500 | එකතුව |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **ගම්පහ දිස්ත්‍රික්කය** | | | | |
| 19 | වේයන්ගොඩ - 01 | 29040 | 5900 | ආහාර දෙපාර්තමේන්තුව |
| 20 | වේයන්ගොඩ - 02 | 21750 | 4000 | ඒබල් හොල්ඩින්ස් (පුද්.) සමාගම |
| 21 | වේයන්ගොඩ - 03 | 6142 | 1200 | ආහාර දෙපාර්තමේන්තුව |
| 22 | වේයන්ගොඩ - 04 | 7552 | 900 | බණ්ඩාර ඉන්ඩස්ට්‍රියල් සර්විසස් |
| 23 | වේයන්ගොඩ - 05 | 12373 | 1400 | ආහාර දෙපාර්තමේන්තුව |
| 24 | වේයන්ගොඩ - 06 | 7568 | 1100 | ආහාර දෙපාර්තමේන්තුව |
| 25 | වේයන්ගොඩ - 07 | 28860 | 5400 | |
| 26 | වේයන්ගොඩ - 08 | 28860 | 5400 | ආහාර දෙපාර්තමේන්තුව |
| 27 | වේයන්ගොඩ - 09 | 28860 | 5400 | ආහාර දෙපාර්තමේන්තුව |
| 28 | වේයන්ගොඩ - 10 | 28860 | 5400 | ආහාර දෙපාර්තමේන්තුව |
| 29 | වේයන්ගොඩ - 11 | 33200 | 6200 | දොන් මියොන් ආයතනය |
| 30 | වේයන්ගොඩ - 13 | 24288 | 6800 | ආහාර දෙපාර්තමේන්තුව |
| 31 | වේයන්ගොඩ - 16 | 6370 | 1200 | ලංකා සතොස |
| 32 | වේයන්ගොඩ - 17 | 6279 | 770 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය |
| **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | |
| 33 | මහව අංක - 01 | 4698 | 800 | වී අලෙවි මණ්ඩලය |
| 34 | මහව අංක - 02 | 13118 | 1300 | |
| 35 | මල්කඩුවාව අංක - 01 | 5227 | 2000 | ෂෙයිඩ් මොහොමඩ් සමාගම |
| 36 | මල්කඩුවාව අංක - 02 | 4827 | 2000 | |
| 37 | මල්කඩුවාව GI) ගබඩාව | 10498 | 2000 | ආහාර දෙපාර්තමේන්තුව |
| 38 | ගැට්ටුවාන අංක - 01 | 6336 | 2000 | වී අලෙවි මණ්ඩලය /ලක් සතොස |
| 39 | ගැට්ටුවාන අංක - 02 | 5544 | 2000 | සෙලින් එක්ස්පෝර්ට් |
| 40 | ගැට්ටුවාන අංක - 03 | 5544 | 2000 | ස.තො.ස |
| 41 | ගැට්ටුවාන අංක - 04 | 5544 | 2000 | |
| **මහනුවර දිස්ත්‍රික්කය** | | | | |
| 42 | පල්ලෙකැලේ - පාවිච්චි නොකරන නිෂ්ක්‍රිය ගබඩා | 15484 | 1500 | එච්.එම්.එස්. ධර්මසේන |
| 43 | කටුගස්තොට ගබඩාව | 6490 | 1700 | ට්‍රෙන්ඩ්ස් මාර්කටින් |
| **කෑගල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 44 | කෑගල්ල - පරගම්මන 01 | 5500 | 1500 | දි.ලේ කෑගල්ල |
| 45 | කෑගල්ල - පරගම්මන 02 | 5500 | 1500 | |
| 46 | කෑගල්ල - පරගම්මන 03 | 3960 | - | |
| **ගාල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 47 | බූස්ස අංක - 02 | 23721 | 3750 | ලංකා සතොස/දි.ලේ |
| 48 | බූස්ස අංක - 03 | 23721 | 3750 | ලංකා සතොස |
| 49 | බූස්ස අංක - 04 | 56784 | | ප්‍රා.ලේ.(හික්කඩුව) |
| 50 | බූස්ස අංක - 05 | 55770 | | |
| 51 | කටුගොඩ අංක - 01 | 20545 | 3825 | ට්‍රයිකෝ මෙරිටයිම් |
| 52 | කටුගොඩ අංක - 02 | 9532 | 1775 | |
| **එකතුව** | | **558345** | **86470** | |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **මාතර දිස්ත්‍රික්කය** | | | | |
| 53 | මැද්දවත්ත අංක - 01 | 7264 | 965 | වී අලෙවි මණ්ඩලය |
| 54 | මැද්දවත්ත අංක - 02 පාවිච්චි නොකරන නිෂ්ක්‍රිය ගබඩා | 10000 | 1870 | දිස්ත්‍රික් ලේකම් (මාතර) |
| 55 | වැලිගම ගබඩාව | 8019 | 1300 | පියසිරි ස්ටෝර්ස් |
| **හම්බන්තොට දිස්ත්‍රික්කය** | | | | |
| 56 | හම්බන්තොට ගබඩාව | 14023 | 4500 | වී අලෙවි මණ්ඩලය |
| 57 | කහඳාව අංක - 01 | 3517 | 1900 | වී අලෙවි මණ්ඩලය |
| 58 | කහඳාව - නව | 7090 | 1900 | මියාමි ආයතනය |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | |
| 59 | ශ්‍රාවස්තිපුර අංක - 01 | 25520 | 3575 | |
| 60 | ශ්‍රාවස්තිපුර අංක - 02 | 23930 | 3350 | වී අලෙවි මණ්ඩලය |
| 61 | කැකිරාව අංක - 01 | 7950 | 1275 | |
| 62 | කැකිරාව අංක - 02 | 7150 | 1145 | |
| 63 | සේනානායක අංක - 01 | 2461 | 390 | සී/ස ජනතා ඒකාබද්ධ ගොවි සමා. |
| 64 | සේනානායක අංක - 02 | 2461 | 396 | දේශීය වෛද්‍ය අමාත්‍යංශය |
| 65 | සේනානායක අංක - 03 | 11017 | 2400 | වී අලෙවි මණ්ඩලය |
| 66 | සේනානායක අංක - 04 | 2185 | 325 | සී/ස ජනතා ඒකාබද්ධ ගොවි සමා. |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | |
| 67 | කඳුරුවෙල අංක - 01 | 13419 | 2880 | වී අලෙවි මණ්ඩලය |
| 68 | කඳුරුවෙල අංක - 02 | 20187 | 3200 | |
| 69 | හිඟුරක්ගොඩ අංක - 01 | 23550 | 4400 | |
| 70 | හිඟුරක්ගොඩ අංක - 02 | 23550 | 4400 | ස.තො.ස |
| **නුවරඑළිය දිස්ත්‍රික්කය** | | | | |
| 71 | බිලැක්පූල් අංක - 01 | 1514 | 280 | |
| 72 | බිලැක්පූල් අංක - 02 | 1836 | 150 | නුවරඑළිය කෘෂිකාර්මික සමුපකාර සමිතිය |
| 73 | බිලැක්පූල් - 02 ඉහළ මහළ | 1824 | - | |
| 74 | බිලැක්පූල් අංක - 03 | 2335 | 435 | |
| **රත්නපුර දිස්ත්‍රික්කය** | | | | |
| 75 | රත්නපුර ගබඩාව | 9611 | 1800 | සී/ස බඹරබොටුව මාරපන වි.සේ.ස සහ ලංකා සතොස ආයතනය |
| 76 | ඕපනායක අංක - 01 | 7730 | 1335 | ලාල් ස්ටෝර්ස් |
| 77 | ඕපනායක අංක - 02 | 5300 | 850 | විදුලිබල මණ්ඩලය |
| 78 | ඇහැළියගොඩ අංක - 01 | 2337 | 435 | |
| 79 | ඇහැළියගොඩ අංක - 02 | 2373 | 435 | සී/ස ඇහැළියගොඩ වි.සේ.ස |
| 80 | ඇහැළියගොඩ අංක - 03 | 4806 | 900 | |
| 81 | කහවත්ත අංක - 01 | 3180 | 590 | සී/ස පන්නිල්පත්තු වි.සේ.ස |
| 82 | කහවත්ත අංක - 02 | 1881 | 150 | |
| **එකතුව** | | **258020** | **47531** | |

| අනු අංකය | ගබඩාවේ නම | වර්ග අඩි ප්‍රමාණය | ධාරිතාව මෙ.ටො. | කුලියට දී ඇති ආයතනය |
|---|---|---|---|---|
| **මොණරාගල දිස්ත්‍රික්කය** | | | | |
| 83 | මොණරාගල අංක - 01 | 22480 | 3150 | වී අලෙවි මණ්ඩලය |
| **මාතලේ දිස්ත්‍රික්කය** | | | | |
| 84 | මාතලේ අංක - 01 | 21448 | 3000 | මොහොමඩ් අෂ්රොෆ් මයා |
| **බදුල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 85 | බදුල්ල අංක-01 | 7245 | 1380 | ආහාර දෙපාර්තමේන්තුව |
| 86 | බදුල්ල අංක -02 | 6781 | 1500 | විදුලිබල මණ්ඩලය |
| 87 | හපුතලේ අංක - 01 | 1653 | 130 | හපුතලේ වි.සේ.ස |
| 88 | හපුතලේ අංක - 02 | 1806 | 120 | |
| **අම්පාර දිස්ත්‍රික්කය** | | | | |
| 89 | අම්පාර අංක - 01 | 11368 | 2125 | වී අලෙවි මණ්ඩලය |
| 90 | අම්පාර අංක - 02 | 11368 | 2125 | ආහාර දෙපාර්තමේන්තුව |
| **මඩකලපුව දිස්ත්‍රික්කය** | | | | |
| 91 | මඩකලපුව අංක - 01 | 18000 | 6000 | බ්‍රැන්ඩික්ස් ආයතනය |
| 92 | මඩකලපුව අංක - 02 | 17600 | 6000 | බ්‍රැන්ඩික්ස් ආයතනය |
| 93 | මඩකලපුව අංක - 03 | 17600 | 6000 | බ්‍රැන්ඩික්ස් ආයතනය |
| 94 | මඩකලපුව අංක - 04 (දුම්රිය පොළ අසළ ගබඩාව) | 13560 | 2800 | සතොස/දි.ලේ(මඩකලපුව) |
| **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | |
| 95 | පුත්තලම අංක - 01 | 5600 | 600 | දි.ලේ (පුත්තලම) |
| 96 | පුත්තලම අංක - 02 | 9600 | 1000 | |
| **වව්නියාව දිස්ත්‍රික්කය** | | | | |
| 97 | වව්නියාව අංක - 01 | 3763 | 775 | ස.තො.ස ආයතනය |
| 98 | වව්නියාව අංක - 02 | 4165 | 165 | දි.ලේ (වව්නියාව) |
| 99-101 | වව්නියාව අංක - 03 | 684 | 160 | |
| **යාපනය දිස්ත්‍රික්කය** | | | | |
| 102 | නාවක්කුලි (ගබඩා 03) | 43200 | 7500 | දිස්ත්‍රික් ලේකම් (යාපනය) |
| **මන්නාරම දිස්ත්‍රික්කය** | | | | |
| 103 | මුරුන්කන් | 9720 | 1500 | ලෝක ආහාර වැඩසටහනට ලබා දී ඇත |
| **එකතුව** | | **227641** | **46030** | |
| **මුළු එකතුව** | | **1368930** | **246531** | |

# ශ්‍රී ලංකාව තුළ ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල ව්‍යාප්තිය



## ❖ ගබඩා ආදායම

| වර්ෂය | ලැබිය යුතු ආදායම රු. | ලැබූ ආදායම රු. |
|---|---|---|
| **2015** | 88,285,229.27 | 73,140,466.30 |
| **2016** | 83,907,168.00 | 92,155,249.99 |




## ❖ නිවාස ආදායම

| වර්ෂය | ලැබිය යුතු ආදායම රු. | ලැබූ ආදායම රු. |
|---|---|---|
| **2015** | 5,451,575.00 | 4,608,793.59 |
| **2016** | 4,987,320.00 | 4,610,548.25 |



# (08). ගිණුම් ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය

ආහාර සුරක්ෂිතතාවය පදනම් කරගත් රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ කාර්යයක් සේ සලකා කටයුතු කරමින්, දෙපාර්තමේන්තුවේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම සකසා තිබුනි. එම ගමන් මග සාක්ෂාත් වන අන්දමින් ඊට අදාළ 2016 වාර්ෂික ඇස්තමේන්තුව සකසන ලදී.

දෙපාර්තමේන්තුව විසින් සකසන ලද ඇස්තමේන්තුව මගින් දක්වන ලද ඇතැම් වැය විෂයන් යටතේ ඉල්ලා සිටින ලද ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුව මගින් සලසා දී නොතිබුණි.

තවද ප්‍රතිපාදන ලබා දි තිබූ වැය විෂයන් සඳහා පාලනය කළ හැකි වියදම් පාලනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කරන ලදී. වර්ෂය ආරම්භයේදී සකසන ලද ප්‍රසම්පාදන සැලැස්ම හා ඊට අතිරේකව දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් මු.රෙ.66 මාරු කිරීම් අනුව ඉටු කර ගත හැකි විය.

## පුනරාවර්තන වියදම්

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අවම හා පාලනීය වියදම් ප්‍රතිපත්තිය 2016 වර්ෂයේදී ද ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු මගින් පුනරාවර්තන වියදම් යටතේ සලසා දෙන ලද ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීම පහසුවක් වූ අතර වියදම් පාලනය හේතුවෙන් ඇතැම් වැය විෂයන්ගේ ඇතිවූ ප්‍රතිපාදන අතිරික්තය මු.රෙ.66 ප්‍රකාරව නිසි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අත්‍යවශ්‍ය වැය විෂයන් කිහිපයක් වෙත මාරු කර ගන්නා ලදී.

ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා නොයෑමට වග බලා ගැනීමත්, අවශ්‍ය ප්‍රමාණයට ප්‍රතිපාදන ප්‍රතිශෝධනය කර ගැනීමට හැකිවීමත් මත ගිණුම්කරණ නීතිරීති හා උපදෙස් වලට අනුකූල නොවීමේ අවදානමෙන් මෑත් වීමට දෙපාර්තමේන්තුවට හැකිවී ඇත.

## මූලධන වියදම්

මූලධන වැය විෂයය මත වාර්ෂික ඇස්තමේන්තු මගින් සලසා දී තිබූ ප්‍රතිපාදන උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත. සහල් මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදනයන් අපේක්ෂා කළ ආකාරයට භාවිතා කළ නොහැකි වූයේ දෙපාර්තමේන්තුව අපේක්ෂා කළ ආකාරයට ගබඩා වෙත සහල් නොලැබීම මතය.

## ඇවර කිරීමේ ගිණුම්

දෙපාර්තමේන්තුව සතු ඇවර කිරීමේ ගිණුම් දෙක අතුරින් මුළුතැන්ගෙය හා බේකරි අත්තිකාරම් ගිණුමේ පවතින්නාවූ එකම වගකීම වූ කාරක අලාභ ලියා හැරීම සඳහා අනුමැතිය ලබාගෙන ඇති අතර 2016 වර්ෂයේදී ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත. අනෙක් ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුම වූ ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුම සඳහා වන ඇවර කිරීමේ ගිණුමෙහි දැක්වෙන්නා වූ වත්කම් දැනට ආහාර දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් කටයුතු සඳහා යෙදවී ඇති බැවින් ඒවා උපලබ්ධි කිරීමේ ගැටළු ඇතිවී තිබේ. එබැවින් අදාළ ගිණුම අවසන් කිරීමේ කටයුතු කඩිනම් කිරීමේ හැකියාව අවම වී ඇත. ණයගැති ශේෂ ලියා හැරීමට අනුමැතිය ලබා ගැනීම ද කාරක පාඩු අදියර ගතව ලැබෙන ප්‍රතිපාදන මත ලියා හැරීම් ඉදිරියේදී සිදුකිරීමට ද නියමිතව ඇත.

රාජ්‍ය ප්‍රතිපත්තිය මත පවත්නා කාලීන අවශ්‍යතාවයන් මූලික කොටගෙන දෙපාර්තමේන්තුව වර්ෂය තුළ ගෙන ඇති ක්‍රියාමාර්ග ඉතා වැදගත් තත්වයක පවතී. එම කටයුත්ත ඉටුකිරීමෙහිලා උද්ගත වූ ප්‍රායෝගික තත්වයන් යටතේ උපරිම කැපවීමකින් හා විනිවිද භාවයෙන් යුතුව හා සියළු නීතිරීතිවලට අනුකූලව කටයුතු කරමින් ගැටළුවකින් තොරව වර්ෂයට අදාල ගිණුම් කටයුතු අවසන් කිරීමට හැකිවිය.

# (09). වත්කම් හා දේපල

දෙපාර්තමේන්තුව තුළ පවත්නා වත්කම්, ආහාර බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ අත්පත් කරගෙන ඇති වත්කම් වශයෙන් පවතිනු ලැබ ඇත. එම වත්කම් සියල්ල දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු සඳහා 2016.12.31 දින වන විටත් උපයෝගී කර ගනිමින් පැවතින.

ඒ අනුව 2016.12.31 දිනට වත්කම් විශ්ලේෂණය පහත පරිදි වේ.

| # | **වත්කම්** | **පිරිවැය වටිනාකම 2016.12.31 දිනට රුඃ ශතඃ** |
|---|---|---|
| **I. ආහාර බෙදා හැරීමේ අත්තිකාරම් ගිණුම යටතේ පවත්නා වත්කම්** | | |
| | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 121,065,254.11 |
| | වාහන | 13,499,924.37 |
| | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 9,215,359.14 |
| | ලී බඩු සහ කාර්යාලයීය උපකරණ | 22,962,954.35 |
| | **මුළු එකතුව** | **166,743,491.97** |

# (10). ආදායම් සහ අය කිරීම්

- **ආදායම් :**

| # | 2017.01.01 දිනට අයවිය යුතුව පැවති ණය ශේෂය | |
|---|---|---|
| I. | ගබඩා කුලිය | රු: 68,803,092.19 |
| II. | නිවාස කුලිය | රු: 3,882,078.74 |
| | **එකතුව** | **රු:72,685,170.93** |

| # | වර්ෂය තුළ අය කරගත් ආදායම | |
|---|---|---|
| I. | ගබඩා කුලිය | රු: 92,155,249.99 |
| II. | නිවාස කුලිය | රු: 4,610,548.25 |
| | **එකතුව** | රු: **96,765,798.24** |

| # | 2016.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය | |
|---|---|---|
| I. | ගබඩා කුලිය | රු: 68,803,092.19 |
| II. | නිවාස කුලිය | රු: 3,882,078.74 |
| | **එකතුව** | රු: **72,685,170.93** |

- **අයකිරීම් :**

❖ **සමූපකාර ණය ශේෂයන් :**

| | |
|---|---|
| 2016.01.01 දිනට සමූපකාර වෙතින් අයවියයුතුව පැවති ණය ශේෂය | රු: 199,506,413.71 |
| වර්ෂය තුළ අය කරගත් වටිනාකම | රු: 27,645,047.57 |
| 2016.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය | රු: 171,861,366.14 |

❖ **තොග හිඟ අය කිරීම් (අධිභාර ණය ශේෂයන්) :**

| | |
|---|---|
| 2016.01.01 දිනට අධිභාර අයවිය යුතු ණය ශේෂය | රු: 49,422,447.80 |
| 2016 වර්ෂය තුළ පනවන ලද අධිභාර වටිනාකම | - |
| වර්ෂය තුළ අයකරගත් අධිභාර වටිනාකම | රු: 5,877.88 |
| 2016.12.31 දිනට අයවිය යුතුව පැවති ණය ශේෂය | රු: 49,416,569.92 |

# (11). මූල්‍ය වාර්තා

ශීර්ෂ අංකය : 300
අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව : ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
වැඩසටහන් අංකය : 01
ව්‍යාපෘතිය : 01

**පුනරාවර්තන වියදම්**

| විස්තරය | 2015 සත්‍ය වියදම රු: ශත: | 2016 අනුමත ඇස්තමේන්තුව රු: ශත: | 2016 සංශෝධිත ඇස්තමේන්තුව රු: ශත: | 2016 සත්‍ය වියදම රු: ශත: | 2016 ඉතිරිය රු: ශත: |
|---|---|---|---|---|---|
| පුද්ගල වේතන | 51,303,035.00 | 52,900,000.00 | 52,900,000.00 | 52,108,724.00 | 791,276.00 |
| වෙනත් | 141,338,459.00 | 247,150,000.00 | 245,999,000.00 | 242,168,848.00 | 3,803,651.00 |
| **එකතුව** | **192,641,494.00** | **300,050,000.00** | **298,899,000.00** | **294,277,572.00** | **4,594,927.00** |

| මූලධන වියදම් | | 2015 සත්‍ය වියදම රු: | 2016 අනුමත ඇස්තමේන්තුව රු: | 2016 සංශෝධිත ඇස්තමේන්තුව රු: | 2016 සත්‍ය වියදම රු: | 2016 ඉතිරිය රු: |
|---|---|---|---|---|---|---|
| වැය විෂය | විස්තරය | | | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම් | | | | | | |
| 2001 | ගොඩනැගිලි හා ඉදි කිරීම් | 666,833.03 | 1,000,000.00 | 56,730,000.00 | 46,950,872.88 | 9,779,127.12 |
| 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | - | - | - | - | - |
| 2003 | වාහන | 530,560.00 | 500,000.00 | 686,000.00 | 712,050.00 | 450.00 |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | - | - | - | - | - |
| 2102 | ලී බඩු හා කාර්යාලයීය උපකරණ | 507,329.90 | - | 875,000.00 | 938,725.00 | 275.00 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 67,499.98 | - | 90,000.00 | 185,000.00 | 27,750.00 |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 235,000.00 | 250,000.00 | 250,000.00 | 470,830.00 | 260.00 |
| 2502 | ආහාර දෙපාර්තමේන්තු ගබඩා අළුත්වැඩියාව | - | 5,000,000.00 | 770,000.00 | 325,000.00 | 37,160.00 |
| | **එකතුව** | **2,007,222.91** | **6,750,000.00** | **59,401,000.00** | **49,582,477.88** | **9,845,022.12** |

| මූල්‍ය ප්‍රභවයන් වැඩ සටහන | විස්තරය | 2015 සත්‍ය වියදම රු: | 2016 අනුමත ඇස්තමේන්තුව රු: | 2016 සංශෝධිත ඇස්තමේන්තුව රු: | 2016 වියදම රු: | 2016 ඉතිරිය රු: |
|---|---|---|---|---|---|---|
| 01. | ඒකාබද්ධ අරමුදල | 194,648,717.39 | 306,800,000.00 | 358,300,000.00 | 343,860,050.48 | 14,439,949.52 |
| 07. | විසර්ජන නීතිය | - | - | - | - | - |
| | විශේෂ නීති සේවා | - | - | - | - | - |
| | විදේශාධාර | - | - | - | - | - |
| | ණය | - | - | - | - | - |
| | ආධාර | - | - | - | - | - |
| | ප්‍රතිපූර්ණ කළ හැකි විදේශාධාර | - | - | - | - | - |
| | ණය | - | - | - | - | - |
| | ආධාර | - | - | - | - | - |
| | ප්‍රතිපාර්ශවීය අරමුදල් | - | - | - | - | - |
| | විදේශාධාර | - | - | - | - | - |
| **01+07** | **මුළු වියදම** | **194,648,717.39** | **306,800,000.00** | **358,300,000.00** | **343,860,050.48** | **14,439,949.52** |

# (12). ක්‍රියාකාරිත්වය හා ප්‍රගතිය

## ▪ ආදායම් ප්‍රවර්ධනය

1. දෙපාර්තමේන්තුව සතු ගබඩා අතරින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිත නොකරන ලද ගබඩා බාහිර ආයතන වෙත කුලියට/බද්දට ලබාදීම හා ධාන්‍යාගම පිහිටි ප්‍රීමා නිවාස කුලියට දීම ප්‍රධාන ආදායම් ප්‍රභවය වූ අතර ආදායම් ප්‍රවර්ධනය සඳහා අදාල ගාස්තු සංශෝධනය කිරීමටත්, ගිවිසුම් ගත අඩුපාඩු මගහරවා ගැනීමටත් ඒ අනුව නව ගිවිසුම් වලට එළඹීමටත් කටයුතු කර ඇත.

2. ඒ අනුව රු. 92,155,249.99 ක ගබඩා ආදායමක් සහ රු. 4,610,548.25 ක නිවාස ආදායමක් රජයේ ආදායමට බැර කිරීමට හැකියාව ලැබී ඇති අතර, එමගින් රජයේ ආදායම වර්ධනය කර ගැනීම සඳහා දායකත්වය ලබාදී ඇත.

3. දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙමින් පැවති වාණිජ අත්තිකාරම් ගිණුම් දෙකකි. ඉන් එකක් වූ දැනට ඇවර කරමින් පවතින ආහාර බෙදාහැරීමේ අත්තිකාරම් ගිණුමෙහි පැවැති ආහාර මුද්දර යටතේ බෙදාහැරීම සඳහා සමූපකාර සමිති වෙත ලබාදුන් භාණ්ඩ වෙනුවෙන් අයවීමට පැවැති මුදලින් රු. 27,645,047.57 ක වටිනාකමක් අයකර ගැනීමට කටයුතු කිරීම.

- එම ගිණුම යටතේ අයවිය යුතුව පැවති තොග හිඟ අධිභාර ශේෂයෙන් රු. 5,877.88 මුදලක් අයකර ගැනීමට ද හැකි වී ඇත.
- දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවූ අනෙක් වාණිජ අත්තිකාරම් ගිණුම වූ ඇවර කරමින් පැවති මුළුතැන්ගෙය හා බේකරි අත්තිකාරම් ගිණුමේ පවත්නා කාරක අලාභ ශේෂය හැරෙන්නට අනිකුත් වත්කම් හා වගකීම් පියවා දමා ඇති අතර, අදාළ ශේෂය ලියා හැරීම සඳහා ඇවැසි ප්‍රතිපාදන සලසා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට 2016 වර්ෂයේදී කටයුතු කර ඇත.